# ප්‍රධාන කරුණු ලේඛනය - ව්‍යාපෘති මූල්‍ය අංශය

| නිෂ්පාදනය | විස්තරය | මූල්‍ය සහ වෙනත් ප්‍රතිලාභ | අනුගමනය කල යුතු ක්‍රියා පටිපාටිය | ප්‍රධාන නියමයන් සහ කොන්දේසි |
|---|---|---|---|---|
| **ව්‍යාපෘති මූල්‍ය දෙපාර්තුමේන්තුව මඟින් දෙනු ලබන කාලීන ණය** | නව ව්‍යාපෘති සඳහා මුදල් යෙදවීම, පුළුල් කිරීම්, ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහ ගත කිරීම, දිගු කාලීන ස්ථාවර කාර්ය ප්‍රාග්ධන අවශ්‍යතා සහ වෙනත් ඕනෑම කටයුත්තක් සඳහා දිගු කාලීන ණය ලබා දීම. | පාරිභෝගිකයින් විසින් ක්‍රියාත්මක කිරීමට අදහස් කරන ව්‍යාපෘති සඳහා අවශ්‍ය හිඟ අරමුදල් සම්පාදනය කරගැනීම සඳහා අවශ්‍ය දිගු කාලීන ණය | 1. 2347912 හෝ 2448448 ( දිගු අංක - 3387) යන අංක මඟින් ව්‍යාපෘති මූල්‍ය දෙපාර්තුමේන්තු ප්‍රධානී අමතන්න.<br><br>2. ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යනය සහ අදාළ බලධාරීන්ගේ අනුමැතිය ලබා ගැනීම සඳහා අදාළ කර්මාන්ත ක්ෂේත්‍රයට අනුකූලව අදාළ සම්බන්ධතා කළමනාකරු/ අංශ ප්‍රධානියා හමුවන්න.<br><br>3. සම්බන්ධතා කළමනාකරු ශක්‍යතා වාර්තාව පරීක්ෂා කිරීමෙන් අනතුරුව අවශ්‍ය නම් පමණක් අදාළ පැහැදිලි කිරීම් ලබා ගනු ඇත.<br><br>4. ප්‍රතිපත්තිමය වශයෙන් නියාමයන් සහ කොන්දේසි / මිල ගණන්, පාරිභෝගිකයා විසින් එකඟ විය යුතු මූලික අධ්‍යයනයෙන් පසුව ඉදිරිපත් කරනු ලැබේ.<br><br>5. මිල ගණන් ඉදිරිපත් කිරීම් ලබාගත් පසුව අදාළ ව්‍යාපාර අංශය, මූලික අනුමැතිය සඳහා ණය කමිටුව වෙත මූලික වාර්තාවක් යොමු කරනු ඇත.<br><br>6. මූලික අනුමැතිය ලැබීමෙන් අනතුරුව අවශ්‍ය ක්‍රියාවලිය ආරම්භ කරනු ලැබේ.<br><br>7. ව්‍යාපෘතියේ සංකීර්ණත්වය සහ සේවාදායකයා විසින් යොමු කරන ලද තොරතුරු මට්ටම අනුව අදාළ ක්‍රියාවලිය සඳහා ගතවන කාලය වෙනස් විය හැක.<br><br>8. නියමිත ක්‍රියාවලිය සම්පූර්ණ කර අදාළ නිලධාරියාගේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව, සේවාදායකයා විසින් පිළිගැනුම සඳහා පහසුකම් පිරිනැමීමේ ලිපිය/කොන්ත්‍රාත්තුව ඉදිරිපත් කරනු ලැබේ. | ව්‍යාපෘති මූල්‍ය පහසුකම් වල සම්මත නියමයන් පහත දැක්වේ. කෙසේ වෙතත් මෙම නියමයන් ව්‍යාපෘතියේ ස්වභාවය අනුව ව්‍යාපෘතියෙන් ව්‍යාපෘතියට වෙනස් වන අතර සාකච්ඡා වලට යටත් වෙමින් සහ,<br><br>***1. අරමුදල් ව්‍යුහය***<br>▪ ණය : කොටස් 60 : 40<br>▪ කොටස් දායකත්වය ඉදිරියට ගෙන ඒම<br><br>***2. පොලී අනුපාතය***<br>▪ මාසිකව ගෙවිය යුතුය<br>▪ රුපියලේ අගය මත - වාර්ෂිකව AWPLR + 2.0% සිට 3.0% දක්වා<br>▪ USD ඩොලරයේ අගය මත - වාර්ෂිකව LIBOR _ 6.00% සිට 8.5% දක්වා<br>▪ සෑම මසකම අවසානයේ ගෙවිය යුතු ශේෂය අඩු කිරීම මත ගණනය කරන ලද පොලිය<br><br>***3. කාල සීමාව***<br>▪ අවුරුදු 1.5 සිට අවුරුදු 10 අතර කාලය (පහත සඳහන් සහන කාලයද ඇතුළුව )<br>▪ සහන කාලය - මස 1 සිට අවුරුදු 2 අතර<br><br>***4. ප්‍රාග්ධන ආපසු ගෙවීම්***<br>▪ මාසිකව ගෙවීම්<br>▪ ව්‍යාපෘතියේ/සමාගමේ මුදල් ප්‍රවාහයට සරිලන පරිදි සැකසූ ව්‍යුහගත වාරිකය<br><br>***5. ආරක්ෂාව***<br>▪ ව්‍යාපෘතියේ ස්වභාවය මත රඳා පවතී<br>▪ පොදුවේ ගත් කල - ව්‍යාපෘතිය/සමාගම් වත්කම්, සමාගම් කොටස්, ආයතනික ඇපකරය, පුද්ගලික ඇපකරය සහ වෙනත් ඕනෑම ආරක්ෂණයක්<br>▪ අවශ්‍ය පරිදී වෙනත් ණය ප්‍රමාණයන් වැඩි කිරීම |

| | | | | |
|---|---|---|---|---|
| | | | 9. නෛතික/ආරක්ෂණ ලියවිලි අත්සන් තැබීමෙන් පසුව එකඟ වූ කාල සීමාව තුළ හා එකඟ වූ ණය කොටස් අනුපාතය මත බෙදාහැරීම සිදු කරනු ලැබේ.<br><br>10. අදාළ ක්‍රියාවලිය අතරතුර විවිධ අදියරයන් තුළ බැංකු නිළධාරීන් විසින් අදාළ ව්‍යාපෘති ස්ථානයට/ආයතනයට පැමිණීම සිදු කරයි.<br><br>**11. පැමිණිලි ඉදිරිපත් කල යුතු ආකාරය -**<br><br>සහකාර උප සභාපති - මූල්‍ය ව්‍යාපෘති වෙත ලිපියක් යොමු කිරීමෙන් අදාළ පැමිණිලි ඉදිරිපත් කල හැක. | ***6. ගාස්තු***<br><br>▪ මූලික ගාස්තු - පිරිනමනු ලබන පහසුකමෙන් 0.25% සිට 1.5% අතර<br>▪ නෛතික ගාස්තු - ලබා දී ඇති පහසුකමෙන් 0.2% පමණ<br>▪ මුද්දර ගාස්තු සහ අනෙකුත් ව්‍යවස්ථාපිත ගාස්තු - රජයේ රෙගුලාසි වලට අනුකූලව<br>▪ අවලංගු කිරීමේ ගාස්තු - 0.75%<br>▪ බැඳීම් ගාස්තු - 1.0%<br>▪ පෙරගෙවුම් හානි - පෙරගෙවුම් පහසුකම සහ පහසුකමේ කාල සීමාව මත පදනම් වූ ප්‍රතිශතයක්<br>▪ LC/ නැව් ඇපකර/ බැංකු ඇපකර ගාස්තු - බැංකුවේ සම්මත ගාස්තු ව්‍යුහය අනුව<br>▪ ආනුභූතික ගාස්තු - එක් එක් අවස්ථාව අනුව<br>▪ අනෙකුත් ගාස්තු |